**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 132,903,015 ක් වූ පරිසනක උපකරණ , අස්පෘශ්‍ය වත්කම් , ජල උපාංග හා විදුලි උපකරණ , පුස්තකාල පොත් , සැරසිලි උපකරණ , රසායනාගාර උපකරණ , කාර්යාල උපකරණ , ලී බඩු හා සවිකිරීම් සහ යන්ත්‍ර හා උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | විමසුමේ සඳහන් පරිසණක උපකරණ, අස්පෘශ්‍ය වත්කම්, ජල උපාංග හා විදුලි උපකරණ, පුස්තකාල පොත්, සැරසිලි උපකරණ, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් සහ යන්ත්‍ර උපකරණ ප්‍රත්‍යාගණන කිරීම සිදුකිරීමට අධික වියදමක් දැරීමට සිදුවන හෙයින් ඊට අනුමැතිය ලැබී නොමැත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කරනු ලැබූ වත්කම්වල ඵලදායි ජීව කාලය විධිමත් ක්‍රමවේදයකට නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලංකා බැංකු කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ ගිණුම් අංක 1633709 දරන ගිණුමෙහි සහ ලංකා බැංකු බම්බලපිටිය ශාඛාවේ අංක 718391 දරන ගිණුමෙහි ගනුදෙනුකරුවන් විසින් සෘජුවම තැන්පත් කරන ලද පිළිවෙලින් රු. 2,602,782 ක හා රු. 4,900,294 ක මුදල් වෙනුවෙන් ආදායම් මූලාශ්‍රය හඳුනාගැනීමට නොහැකිව තිබුණු අතර පසුගිය වර්ෂයන්හි ආදායම් මූලාශ්‍රය හඳුනා ගත නොහැකි වූ ආදායම් ප්‍රමාණය රු.4,326,882 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් රු.11,829,958 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ගිණුම් අංක 1633709 හි කොල්ලුපිටිය දෙවන ශාඛාවේ ගනුදෙනුකරුවන්ගේ සෘජු තැන්පතුහි ආදායම් මූලාශ්‍ර හඳුනාගැනීමට නොහැකිව තිබූ අතර 2023 අප්‍රේල් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන විට හඳුනාගත හැකි සියලු තැන්පතු අදාළ ආදායම් මූලාශ්‍රයන්ට ගිණුම්ගත කළ අතර හඳුනාගත නොහැකි තැන්පතු කිහිපයක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර, 2022 වසරට ආදාළ සියලු සෘජු තැන්පත් සඳහා ගැළපුම් සිදු කර ඇත. | සෘජු තැන්පතු සම්බන්ධයෙන් ආදායම් මූලාශ්‍රය නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2023 පෙබරවාරි 6 සිට 10 දක්වා රුසියාවේ මොස්කව් හිදී පැවැත්වීමට නියමිත"Prodexpo 2023" ප්‍රදර්ශනයෙහි වීසා සහ සංවිධාන කටයුතු සඳහා එරට තානාපති කාර්යාලයට ගෙවන ලද රු.10,437,332 ක ඉදිරියට කළ ගෙවීම් | 2023 වර්ෂය තුළ අදාළ නිවැරදිකිරීම් සිදුකර ඇත. | 2023 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | "Prodexpo 2023" ප්‍රදර්ශනයට 2023 වර්ෂයේදී සහභාගී වන අපනයනකරුවන්ගෙන් අයකරගත් සියයට 50 ක වියදම් කොටස වූ රු. 11,771,399 ක් කලින් ලැබීම් ලෙස ගිණුම් තැබීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ගිණුමට බැර කර තිබුණි. | 2023 වර්ෂය තුළ අදාළ නිවැරදිකිරීම් සිදුකර ඇත. | මෙම මුදල කලින් ලැබීම් ලෙස ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | පසුගිය වර්ෂයන්හි ඉඩම් වටිනාකම යටතේ ප්‍රාග්ධනිත කර තිබුණු රු.8,500,000 ක ගම්පොළ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ගිණුමට මාරු කර තිබුණු අතර, එම අගය මූල්‍ය ප්‍රකාශන තුළ වර්ෂයේ ගොඩනැගිලි මිලදී ගැනීම් වශයෙන් සටහන් කර තිබුණි. | F සටහනෙහි මෙම ගැලපීම අතපසුවීමකින් වර්ෂයේ එකතුවීම් ලෙස නිරූපණය වීම, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි වර්ගීකරණය යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කරනු ඇත. | 2023 වර්ෂයේදී ගිණුම්කරණ දෝෂය නිවැරදි කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| රසායනාගර ආදායම | 19,802,796 | 38,577,200 | 18,774,404 | රසායනාගාර ආදායම් නිසි ලෙස සැසඳීම සඳහා ක්‍රියාවලියක් මේ වනවිට සැකසෙමින් පවතින අතර ඉදිරියේදී මෙවැනි වෙනස්කම් සිදු නොවීමට කටයුතු කරනු ඇත. | රසායනාගාර ආදායම් සැසඳීම කර වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු. 317,232 ක් | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් ලෙස ලැබිය යුතු රු.317,252 ක මුදල | බාහිර පාර්ශවයන් වෙනුවෙන් දැරූ විදේශ ගමන් වියදම් |

| | | |
|---|---|---|
| සහ සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු.79,200 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට, ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එහි මූල්‍ය කළමණාකරු විසින් 2023 ජුනි මස අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අදාළ මුදල නිරවුල් කරන බවට දැනුම් දී ඇත. | කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු.51,604,457 ක මුදලින් රටවල් 15 කින් ඉතිරි වූ රු. 918,679 ක මුදල සහ චීනය, එක්සත් රාජධානිය සහ මොස්කව් යන රටවල තානාපති කාර්යාලවලින් ලැබිය යුතු රු.868,578 ක මුදල අදාළ තානාපති කාර්‍යාලවලින් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත් විගණන දින වන විටත් එම අමාත්‍යාංශයෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් යොමු කරන ලද 2023.01.09 දිනැති ලිපිය ප්‍රකාරව අදාළ ප්‍රේෂණ හඳුනාගැනීමට අවශ්‍ය වන සත්‍යාපන ලිපි ලේඛන සහ අදාළ තොරතුරු ඉල්ලුම් කරන ලද ආකෘති පත්‍රයට අනුකූලව 2023.01.28 දිනට යොමු කරන ලදී.මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් මේ වනවිට විදේශ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට දැනුම් දී නැත. | ලැබිය යුතු මුදල් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ගෙන්වාගත යුතුය. |
| (ඇ) 2019 වර්ෂයේදී ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කම්කරුවන්ට දීපවාලී උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා රු. 8,760,400 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගම වෙත මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අරමුදලින් ගෙවා තිබුණු අතර මෙම අත්තිකාරම් මුදල ගෙවා වසර 03ක් ඉක්මවා ගියද 2022 දෙසැම්බර් 31 දින දක්වා එම ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශිය වැවිලි සමාගම්වල කම්කරුවන්ට දීපාවලී උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා ලබාදුන් රු.8,760,400 ක මුදල නිරවුල් කරන ලෙස ඇල්කඩුව වැවිලි සමාගම වෙත අවස්ථා කිහිපයකදී දැනුම් දුන් අතර ඊට යහපත් ප්‍රතිචාර ලබාදී නොමැති අතර එම මුදල නිරවුල් කර ගැනීමට තවදුරටත් කටයුතු කරමින් පවතී. | මෙම ණය මුදල වැවිලි සමාගමෙන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර මේ සඳහා වගකිවයුතු මණ්ඩලයේ පාර්ශවයන් හඳුනාගෙන ඔවුන් සඳහා විධිමත් පියවර ගත යුතුය. |
| (ඈ) තේ මණ්ඩලය විසින් පවත්වා ගෙන යන ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල මගින් සිදුකරන ලද ප්‍රේෂණයන් විශ්ලේෂණයේදී මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත මෙම අරමුදල විසින් ලබා දී ඇති රු.1,055,625,000 ක ණය | මූල්‍ය ප්‍රකාශනයේ M සටහන අනුව අය විය යුතු රු.10,055,385,399 ක අයවියයුතු මුදල් අයකර ගැනීමට ඉදිරියේදි කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ණය මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |

මුදල් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට තේ කම්හල්හිමියන් විසින් තේ දළු සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති සහ සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු තැන්පතු වටිනාකම රු.92,245,738 ක් වූ අතර ඉන් රු. 6,508,027 ක් වසර 10 ක් තරම් පැරණි තැන්පතු වී තිබුණි. | හරිත තේ සපයන්නන් වෙත අදාළ මුදල් ගෙවීම සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් පලකර සනාථ කිරීම් සහිතව තේ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. අදාළ සනාථ කිරීම් ඉදිරිපත් කරන ලද තේ සපයන්නන් වෙත පමණක් ගෙවීම් සිදුකර ඇති අතර නිසි පරිදි ඉදිරිපත් නොවූ වසර 10 ට වැඩි ප්‍රමාණය ආදායමක් සේ සලකා කටයුතු කිරීමට හා අදායම් ලෙස ගිණුම්ගත කරන ලද තැන්පතු සඳහා සාධාරණ ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් මණ්ඩලීය අනුමැතියට යටත්ව ගෙවීමටද අනුමැතිය දී ඇත. | ගෙවිය යුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන තැන්පතු මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ. 396 (ඈ) | චෙක්පත් නිකුත් කළ දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක සිට එනම් 2019 වර්ෂයේ සිට ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ, කොල්ලුපිටිය ලංකා බැංකුවේ අංක 78285018 දරන ජංගම ගිණුම යටතේ වූ රු.1,078,533 ක චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සහනාධාර සඳහා නිකුත් කරන ලද මෙම චෙක්පත් සහනාධාරලාභින්ට නිකුත් කිරීමට නියමිත වන අතර මේ සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඈ) ප්‍රකාරව කටයුතු කරනු ඇත. | මාස 06 ට වැඩි ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයෝජන ආදායම් සඳහා බදු වියදම හඳුනාගැනීමේදී රු. 10,493,150 ක පොලී අදායම් , බදු අදායමට ගෙන නොතිබුණු බැවින් බදු වියදම හා ගෙවියයුතු බදු වියදම රු.2,518,356 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | රු. 10,493,150 ක පොලී ආදායම සඳහා නියමිත ආදායම් බදු මුදල වන රු. 2,518,356 ක් 2023.05.15 දින දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර ඇත. | නිවැරදිව බදු වියදම හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 210,289,737 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,194,034 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 202,095,703 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංවර්ධන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 32,362,518 කින් පහළ යාම සහ තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදලේ පොලී ආදායමෙන් තේ මණ්ඩලය වෙත මාරු කරන ලද අරමුදල් ප්‍රමාණය රු. 290,228,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විෂයය | 2022<br>රු. | 2021<br>රු. | වෙනස<br>රු. | ප්‍රතිශතය<br>සියයට |
| --- | --- | --- | --- | --- |
| **ආදායම**<br>--------- | | | | |
| රසායනාගාර ආදායම | 19,802,796 | 4,993,851 | 14,808,945 | 297 |
| ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල | 409,228,000 | 119,000,000 | 290,228,000 | 244 |
| ස්ථාවර තැන්පතු පොලී අදායම | 75,129,356 | 22,808,317 | 52,321,039 | 229 |
| වාණිජ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ලාභය | 10,200,165 | 5,015,129 | 5,185,036 | 103 |
| අනෙකුත් ආදයම් | 8,656,261 | 4,951,504 | 3,704,757 | 75 |
| **වියදම්**<br>------- | | | | |
| සංවර්ධන වියදම් | 144,658,596 | 177,021,114 | 32,362,518 | 18 |
| පරිපාලන වියදම් | 504,880,134 | 449,018,159 | 55,861,975 | 12 |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රසායනාගාර ආදායම් සියයට 297 කින් ද , තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදලේ පොලී ආදායමෙන් තේ මණ්ඩලය වෙත මාරු කරන ලද මුදල් ප්‍රමාණය සියයට 244 කින් ද , ස්ථාවර තැන්පතු පොලී අදායම සියයට 229 කින් ද, වාණිජ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ලාභය සියයට 103 කින් ද වැඩිවී තිබුණු අතර සංවර්ධන වියදම් සියයට 18 කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 7 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදි එම අනුපාත 14: 1 ක් වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම් සියයට 15 කින් වැඩි වී තිබුණු නමුත් ජංගම වගකීම් සියයට 124 කින් වැඩි වී තිබීම හේතුවෙන් මෙම අනුපාත පසුගිය වර්ෂය හා සැසඳීමේදි සියයට 50 කින් වෙනස් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන රූඩ් 1. පර්චස් 20 ක වර්ග ප්‍රමාණයක් වූ ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්සකාලීන බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් බස්නාහිර පළාත්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අංක 4/10/37833 දරන ලිපියෙන් අමාත්‍ය අනුමැතිය හිමිවී තිබුණු බව දන්වා තිබුණද, මෙතෙක් බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | කළුතර ප්‍රාදේශිය කාර්යාලය විසින් මේ වනවිට ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් මැණුම් කුලියද ලබා ගෙන ඇති අතර අදාළ ඉඩමේ ඉදිකරන ලද ගොඩනැගිල්ල ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉදිකරන ලද්දකි. ඒ අනුව පාලින්දනුවර ප්‍රාදේශිය ලේකම්ගේද එකඟතාවය මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් එම ගොඩනැගිල්ල 2022 වර්ෂයේ තක්සේරු කර එම වටිනාකම ගිණුම් ගත කර ඇත. | නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ආ) | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන කැලණි වැලි වතු සමාගමෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් මගින් අත්පත් කරගෙන ඇති ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණු නමුත් පිරිවැය රු.148,013,695 ක ගොඩනැගිලි මණ්ඩලය විසින් ඉදිකර තිබුණි. | නුවරඑළිය ප්‍රාදේශිය කාර්යාලයේ ඉඩම පවරා ගැනීමේ කටයුත්ත ප්‍රාදේශිය කාර්යාලය මගින් සිදුකර අදාළ තොරතුරු ලබාදිය යුතුය. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට ලබාගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ව්‍යාපාරික කටයුතු වසර 6 ක කාලයක් සඳහා රු. 8,162,296 ක බදු මුදලකට 2019 වර්ෂයේදී පුද්ගලික පාර්ශවයකට ගිවිසුමකින් පවරාදී | අදාළ අයකිරීම් ලබාගැනීම සඳහා කුලීකරු වෙත ලිඛිතව දැනුවත් කර ඇත. | නොපමාව බදුකරුගෙන් හිඟ කුලී අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දැනට ව්‍යාපාරික කටයුතු කරගෙන යමින් සිටියද , අදාළ පාර්ශවය සමඟ ගිවිසුම්ගත වීමේදී එම ආයතනයේ ගෙවීමේ හැකියාව පිළිබඳ මණ්ඩලය විසින් පරික්ෂා කර නොතිබුණු බැවින් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නුවරඑළිය තේ අලෙවි සැලෙන් මණ්ඩලයට අයවිය යුතු රු. 986,253 ක බදු මුදල සමාලෝචිත වර්ෂය අවසාන දක්වා අය කරගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද “ටී මෝමන්ට්ස් ” නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානය ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කිරීම හා ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ රු.62,603,006 ක අලාභය කපා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ගැනීම නුසුදුසු බව තීරණය කර තිබුණු බැවින් අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | “ටී මෝමන්ට්ස්” නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානය ඇති කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් වන අතර ඊට නිලධාරීන්ගේ මැදිහත්වීමක් සිදු නොවන ලදී. එමනිසා සිදුවී ඇති අලාභය සම්බන්ධයෙන් නිළධාරීන් වග කිවයුතු නොමැති නිසා ඔවුන්ට විරුද්ධ ක්‍රියාකිරීම උචිත නොවන බැව් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | මෙම අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන් හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හඳුනාගෙන එම මුදල් අය කරගැනීමට පරීක්ෂණයක් ආරම්භ කළ යුතුය. |
| (ඉ) | 2009 වර්ෂයේදී රු.32,132,088 කට මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් මේ දක්වා භාවිතයට | එකඟවෙමි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් චෝදනා පත්‍රයේ සහ පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ නිගමනයන් වල සාරාංශ තවදුරටත් තහවුරු කර ගැනීමට පත් කළ නිලධාරියා රෝගී වීම හේතුවෙන් 2023.04.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි වෙනත් නිලධාරියකු පත් කිරීමට තිරණය කර | විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කර මෙම අක්‍රමිකතාවය හේතුවෙන් මණ්ඩලයට සිදුවී ඇති අලාභය, වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණු අතර , මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනුයුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණය අවසන් කර 2022 සැප්තැම්බර් 22 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් චෝදනා පත්‍රයේ සහ විධිමත් විනය පරීක්ෂණයේ නිගමනයන්ගේ සාධාරණ හා අපක්ෂපාති බව තහවුරු කර ගැනීම සඳහා නැවතත් ස්වාධීන නිලධාරියෙකු පත් කර තිබුණු බැවින් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා නොහැකි වී තිබුණද චෝදනා ලත් සහකාර අධ්‍යක්ෂකවරයා සමාලෝචිත වර්ෂය අවසානයේ විශ්‍රාම ගොස් තිබුණු අතර මණ්ඩලය විසින් රු.1,559,775 ක පරිතෝෂික මුදල ද නිලධාරියා වෙත ගෙවීම් කර තිබුණි.විනය පරීක්ෂණ සඳහා රු. 205,454 ක මුදලක්ද මණ්ඩලය විසින් වියදම් කර තිබුණි. | ඇත. එම පත්වීම දැනටමත් සිදුකර ඇති අතර මාසක් ඇතුළත වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | යුතුය. |
| (ඊ) | මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි “Ceylon Tea Museum” හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට 2012 ජූනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව තීරණය වී තිබුණු නමුත්, වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මේ දක්වා මෙම ක්‍රියාවලිය අවසන් කර Ceylon Tea Museum හි අයිතිය පවරාගෙන නොතිබුණු අතර, ණය මුදල් ආපසු ලබාගැනීමටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023.01.13 වන දින පැවති ටී මියුසියම්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සහභාගි වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා ඉදිරියේදී අදාළ ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා දුන් ණය මුදල වෙනුවෙන් හන්තාන පිහිටි “Ceylon Tea Museum” පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායේ කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත් රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් වාර්තා කිරීමට 2022 වර්ෂයේදීද හැකි වී නොතිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්දියාවට සහ පාකිස්ථානයට සිදුකළ මුළු අපනයන ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදි පිළිවෙලින් සියයට 32 කින් හා සියයට සියයකින් ද පහළ ගොස් තිබුණි. | වෙළෙඳපොල ප්‍රවේශය සිමා කරන සහතික කිරීම් සහ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා දිගු ප්‍රමාදයන් පැවතීම , ශ්‍රී ලංකාවේ තේ වල මිල ඉතා ඉහල අගයක පැවතීම , පාකිස්තාන පාරිභෝගිකයන්ගෙන් බහුතරයක් Orthodox සිලෝන් තේ සමග සැසදීමේදී කෙන්යානු CTC තේ සඳහා දැඩි ඇල්මක් නිසා කෝටාව උපරිමව ප්‍රයෝජනයට නොගෙන පවතින අතර සෑම වසරකම පාහේ තේ කිලෝග්‍රෑම් මිලියනයකට වඩා අඩු ප්‍රමාණයක් අපනයනය කරනු ඇත. | නිදහස් වෙළඳ ගිවිසුම්වලින් උපරිම ප්‍රතිඵල අත්කර ගැනීමට ඇති බාධා හඳුනාගෙන එම බාධා මඟහරවා ගැනීම තුළින් අපනයන ප්‍රවර්ධනයට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද අපනයනයද ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක් වුවද, සමාලෝචිත වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementary to International Tea Committee News Bulletin) අනුව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය තුළ තේ අපනයනය හා තේ නිෂ්පාදන ධාරිතාවයන් පහළ ගියද තේ නිෂ්පාදනයේ අගයට සාපේක්ෂව තේ අපනයනයේ ප්‍රගතියක් දක්නට ලැබේ.එය 93.47% සිට 97.18% දක්වා වූ 3.71 % ක ප්‍රමාණයකින් ඉහළ යෑමකි. ප්‍රතිපත්තිමය තීරණයන් මත වූ නිෂ්පාදන පහළ යෑමට සාපේක්ෂව,ශ්‍රී ලංකා තේ සඳහා වූ ඉල්ලුම සපුරාලමින් ඉහළ ප්‍රතිශතයක් වාර්තාකරමින් නිෂ්පාදනයට සාපේක්ෂව අපනයනයේ ප්‍රගතියක් (2022) පසුගිය වර්ෂය තුළ දක්නට ලැබුණි. | තේ නිෂ්පාදනය වර්ධනය කරගැනීමට සහ ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස වර්ධනය කරගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වාර්ෂික සැලැස්ම අනුව විදේශීය වෙළඳ ප්‍රදර්ශන 34 ක් සඳහා සහභාගී වීමට සැලසුම් කර රු.200,000,000 ක් අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළදී වෙළඳ ප්‍රදර්ශන 25 ක් සඳහා සහභාගී වීම වෙනුවෙන් රු.104,201,553 ක් වියදම් කර තිබුණි. මණ්ඩලය විසින් තෝරාගන්නා ලද අපනයනකරුවන් සඳහා විදේශ වෙළඳ සල්පිල් වලට සහභාගී වීමට අවස්ථාව හා සහනාධාර ලබා දීමෙන් පසුව, එම වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු නොවීම හා වෙළඳ ප්‍රදර්ශනයෙන් අනතුරුව අපනයනකරුවන්ගේ ප්‍රගතිය ඇගයීම සඳහා ඇගයීම් පත්‍රිකා (Evaluation Form) ලබාදී, ලැබුණු ඇණවුම් හා එහි වටිනාකම් පිළිබඳ දත්ත ලබා ගත්තද, අදාළ අපනයන කරුවන්ගේ සත්‍ය අපනයන වර්ධනය පිළිබඳව ඇගයීමක් සිදු නොවීම තුළින් අපනයනකරුවන් හට ලබාදුන් සහනාධාර මුදල් ඵලදායී ආකාරයට යෙදවුයේද යන්න පිළිබඳ ප්‍රමාණවත් ඇගයීමක් සිදු වී තිබුණු බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | පසුගිය කොවිඩ් වසංගත සමය තුළ ඇති වූ සංචාරක බාධා හේතුකොට 2022 වර්ෂයේදී විදේශීය වෙළෙඳ ප්‍රදර්ශන සඳහා නැවත අපනයනකරුවන්ගේ සහභාගීත්වයේ ප්‍රවනතාවයක් දක්නට ලැබුණි.<br>මෙහිදී අදාළ වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වන අපනයන කරුවන්ගේ එම ප්‍රදර්ශන අවසානයේ ඇගයීම් පත්‍රිකාවක් මගින් ඒ වනවිට ලබාගන්නා ලද ඇනවුම්හි ප්‍රගතිය තහවුරු කරගැනීමක් සිදු කරනු ලබයි.එහිදී බොහොමයක් ඇනවුම්වල මිල ගණන් හා ඇනවුමේ ස්වභාවය තාවකාලික මට්ටමක පහතින බැවින් අදාළ වෙළෙඳ ප්‍රදර්ශනය අවසන් වී වර්ෂයක් ඉකුත් වූ අවස්ථාවේ සත්‍ය අපනයන වර්ධනය පිළිබඳ ඇගයීමක් සිදු කරන ලබන්නේ එම අපනයන කරුවන්ගෙන් ලබාගන්නා ලද දත්ත හා SLTB දත්ත පද්ධතියේද දත්ත සමගින් සැසදීම තුලිනි.<br>එබැවින් 2022 වර්ෂයේ සහභාගී වූ වෙළෙඳ ප්‍රදර්ශන සඳහා වන අපනයන තත්ත්ව ඇගයීම මෙම වර්ෂය තුලදී (2023) සිදු කරමින් පවතී. | වෙළඳ ප්‍රදර්ශනයක් අවසානයේ එහි ප්‍රගතිය මැනීමට නිර්ණායක සකස් කිරීම හා අපනයන ප්‍රවර්ධනය පිළිබඳ ඇගයීම සඳහා මණ්ඩලය විසින් පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වාදිය යුතුය. |
| (ඈ) | 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ තේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම, තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම ඇතුළු නියාමනය කිරීමේ කටයුතු මණ්ඩලයේ පාලනය යටතේ සිදුවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්තශාලා 76 ක් විසින් අනුමත ධාරිතාවයට වඩා තේ කි.ග්‍රෑ 11,630,711 ක් නිෂ්පාදනය කර තිබුණි. | මෙම කර්මාන්තශාලා වල නිෂ්පාදනය අනුමත ධාරිතාව ඉක්මවා නිෂ්පාදනය කර තිබූ කර්මාන්තශාලා පිළිබඳව දැනට පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින අතර එහිදී අමු තේ දළු ප්‍රමාණය, විදුලිය පරිභෝජනය සැලකිල්ලට ගෙන තේ පාලන පනත අනුව අක්‍රමිකතා සිදුකරන ලද කම්හල් සම්බන්ධයෙන් නිතිමය කටයුතු සිදුකිරිමත් අනෙකුත් කම්හල්හි ධාරිතාව වැඩිකිරිමට කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. | තේ කර්මාන්තශාලා පිළිබඳ අධීක්ෂණ හා නියාමන කටයුතු ශක්තිමත් කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලයේ නිමි තේ තොග ඇසුරුම් කිරීම සඳහා භාවිතා | මෙම අවශ්‍යතාව එක් රැස් කිරීමේ අදියරේදී ලබා නොදුන් නව | ඇසුරුම් තොග පාලනය පරිගණක ගත |

| | | |
|---|---|---|
| කරනු ලබන ඇසුරුම් තොග ලැබීම්, නිෂ්පාදනය සඳහා භාවිතා කිරීම්, පළුදු වූ තොග වාර්තා කිරීම හා ඉවත් කිරීම ඇතුළු ඇසුරුම් තොග චලනය පිළිබඳව පරිගණකගත තොග පාලන ක්‍රියාවලිය තුළට ඇතුළත් කිරීම සම්බන්ධව නිශ්චිත ක්‍රමවේදයක් විගණන දින වන විටත් ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය විය. | අවශ්‍යතාවයකි. මේ වනවිට එම අවශ්‍යතාවය පිළිබඳ ආයතනය දැනුවත් කර ඇති අතර ඒ අනුව එම පහසුකම ඇතුළත් කිරීමට බලාපොරොත්තු වනු ඇත. | කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර තේ අලෙවිකරණ හා ප්‍රවර්ධන අරමුදල වෙතින් රු.220,000,000 ක් 2018 ජුලි 03 වන දින මණ්ඩලය වෙත ලබාගෙන තිබුණද වසර දෙකකට වැඩි කාලයක් එම මුදල් නිෂ්කාර්යව රඳවා ගෙන 2020 සැප්තැම්බර් 30 දින පුද්ගලික ආයතනයක් සමඟ පද්ධතිය ස්ථාපනය සඳහා ගිවිසුම්ගත වී තිබුණි.ඒ අනුව රු.53,964,995 කට සමස්ත පද්ධතියම වසර දෙකයි මාස හයක කාලයකදී පමණ නිමකිරීමට සැලසුම් කළද 2023 අප්‍රේල් 30 දක්වා කාර්යය නිමකර නොතිබුණි.අධි ඇස්තමේන්තුවක් මත මෙම මුදල් ලබාගැනීම හේතුවෙන් රු.166,035,005 ක මුදලක් තවදුරටත් නිෂ්කාර්යව පැවතුන අතර එම අගය අනෙකුත් ගෙවියයුතු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2020 ජූනි 16 අවසාන තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය ලබා දීමෙන් පසු 2020 ජූලි 16 දින Tea Value Chain Management System (TVCMS) ස්ථාපිත කිරීම පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා ව්‍යාපෘතිය ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ වී තිබුණි.<br>COVID19 සංචාරක සීමා කිරීම් හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලයෙන් වසර 1කට ආසන්න කාලයක් ප්‍රමාද විය. සම්පූර්ණ ව්‍යාපෘතිය වෙන් වෙන් වූ අදියර 3 කින් සමන්විත වන අතර ඔවුන් දැනටමත් live environment හි 1 අදියරට අදාළ කොටස් deploy කර ඇත. ඊට අමතරව, ඔවුන් 2 අදියර යටතේ එන කර්මාන්තශාලා ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇත.<br>එම පෞද්ගලික ආයතනයට සම්පූර්ණ මුදලින් 30%ක් පමණ ගෙවීම් කර ඇත. | තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීම හා ඉතිරි මුදල් එම අරමුදලට මාරු කර තේ අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නව ගොඩනැගිල්ලේ මධ්‍යගත වායුසමීකරණ | එවැනි අඩුපාඩුකම් නැවත ඇති නොවන සේ කටයුතු කිරීමට ලිඛිත උපදෙස් ලබාදී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව |

| | | |
|---|---|---|
| පද්ධතිය සැපයීම, සවිකර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ රු.32,182,460 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණි. | | කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය 335 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 246 ක් විය. ඒ අනුව ඉහළ කළමනාකරණ මට්ටමට අයත් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 03 ක් (වර්ෂ 03 සිට මාස 06 ත් අතර) ඇතුළුව පුරප්පාඩු වූ තනතුරු 89 ක් වූ අතර එම තනතුරු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට රජය මගින් පුරප්පාඩු පිරවීම තවකාලිකව අත්හිටුවා ඇති බැවින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පුරප්පාඩු පවතින තනතුරු සඳහාද බඳවාගැනීමට නොහැකි වී ඇත. සේවයේ අවශ්‍යතාවය මත එම පුරප්පාඩු පිරවීම සඳහා දිගින් දිගටම අමාත්‍යංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කලද මෙතෙක් එම පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබාදී නොමැත. කෙසේ වුවද වාර්ෂික ඉලක්ක සපුරමින් කාර්යක්ෂමව තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් වෙත සේවා සැපයීම සඳහා තේ මණ්ඩලයට අනුමත තත්‍ය කාර්යය මණ්ඩලය අවශ්‍ය වන බැවින් එම කාර්ය මණ්ඩලය සංශෝධනය කර අඩුකිරීමට නොහැකි වනු ඇත. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය . |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නව ගොඩනැගිල්ලේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සැපයීම, සවිකර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් 2021 සහ 2022 වර්ෂයන්හි පිළිවෙලින් රු.13,462,663ක් සහ රු.10,684,706ක් ගෙවීම් කර තිබුණද එම කාර්යය සඳහා අදාළ වර්ෂයන්හි අයවැය ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු බැවින් විධිමත් අයවැය පාලනයක් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | විමසුමේ සඳහන් මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සවිකර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන සිදුකරන ලෙස ප්‍රසම්පාදන අංශයෙන් ඉල්ලීමක් නොකළ බැවින් හා 2019 වර්ෂය තුළ වැඩ ආරම්භ කිරීමක් සිදුවූ නිසාවෙන් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම් පමණක් කර තිබුණි. | අයවැය පාලනය ශක්තිමත් කළ යුතුය. |